# ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය සංග්‍රහය සහ මෙවලම්

දෙසැම්බර් 2020

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

# ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය සංග්‍රහය සහ මෙවලම්


ප්‍රකාශනය

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
නො 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර

ප්‍රථම මුද්‍රණය 2020

ISBN 978-955-1417-31-4

පුහුණු විෂය මාලාව සැකසීම සඳහා සහයෝගිතාවය

මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය
කොළඹ විශ්වවිද්‍යාලය

පුහුණු විෂය මාලාව සැකසීම සඳහා මුල්‍යමය දායකත්වය

Save the Children

මුද්‍රණය
Print Zone ආයතනය
Tel: 0112-888355

## මග පෙන්වීම

- මහාචාර්ය මුදිත විදානපතිරණ, සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ සුජාතා අලහප්පෙරුම, නියෝජ්‍ය සභාපති, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- අනෝමා සිරිවර්ධන, අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## උපදේශන කමිටුව

- මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
  (අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය)
- ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය මොහොමඩ් හකීම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය
- හිටපු ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ශාර්යා ස්කානිවල්, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
  (හිටපු අධ්‍යක්ෂ, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය)
- ආචාර්ය එන්. රෝස් විජේසේකර,නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ ශර්මිලා ඇන්තනි පෙරේරා, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ චන්ද්‍රිකා කරුණාරත්න, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
- නීතිවේදී ශානිකා මලල්ගොඩ, අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ ප්‍රීතිකා සකලසූරිය, සහකාර අධ්‍යක්ෂ (නීති), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ යශාලි අබේසුන්දර, හිටපු සහකාර අධ්‍යක්ෂ (නීතිය බලාත්මක කිරීම) , ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## තාක්ෂණික ඇගයීමේ කමිටුව

- නීතිඥ අයේෂා ජිනසේන මෙනවිය, ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල්, නීතිපති දෙපාර්තමේන්තුව
- වෛද්‍ය අයේෂා ලොකුබාලසූරිය, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය විශේෂඥ, පවුල් සෞඛ්‍ය කාර්යාංශය
- එම්.ආර්.ලතීෆ්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති, විශේෂ කාර්යබලකා මූලස්ථානය
- ඒ.ආර්.පී.සී. උදයකුමාර, අපරාධ විද්‍යාව පිළිබඳ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## මොඩියුල ලේඛකයින්

- නීතිඥ උදානි ගම්මන්පිල, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ ශර්මිලා ඇන්තනි, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- රජයේ නීතිඥ යෝදනී සෙල්වනාතන්, නීතිපති දෙපාර්තමේන්තුව
- නීතිඥ කුශාංගිකා නවරත්න , මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්වවිද්‍යාලය
- රජයේ නීතිඥ එම්. එච්. ආර්. එච්. රණසිංහ, නීතිපති දෙපාර්තමේන්තුව

## පරිවර්තනය සහ පරිගණකගත කිරීම

- නීතිඥ චතුරිකා අකුරගොඩ, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ තිළිණි ගලප්පත්ති, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- බී. ඒ සුනේත්‍රා, හිටපු ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- සුමුදු විජේසූරිය, ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- නීතිඥ කුසල් කාවින්ද අමරසිංහ, සහාය සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- නීතිඥ සියාසා ජොහර්දීන්, සහාය සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.

## සමාලෝචනය

- නීතිඥ ශර්මිලා ඇන්තිනි පෙරේරා, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- ආචාර්ය රෝස් විජේසේකර, ජ්‍යෙෂ්ඨ කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය
- නීතිඥ උදානි ගම්මන්පිල, කථිකාචාරිනි, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

## සංස්කාරක

- මහාචාර්ය වසන්තා සෙනෙවිරත්න, නීති පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය

## සහය සංස්කරණය

- බී. ඒ සුනේත්‍රා, හිටපු ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.
- නීතිඥ ලේඛා හේරත් ව්‍යාපෘති සම්බන්ධිකාරක, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.

## ව්‍යාපෘතිය සම්බන්ධීකරණය

- නීතිවේදී ශානිකා මලල්ගොඩ, අධ්‍යක්ෂ (සැලසුම් හා තොරතුරු), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය
- නීතිඥ ප්‍රීතිකා සකලසූරිය, සහකාර අධ්‍යක්ෂ (නීති), ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**පිටකවර නිර්මාණය** : බුද්ධිනී අනුරාධා සෙනෙවිරත්න, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

**සැකැස්ම** : තිළිණි චන්ද්‍රසේකර, මානව හිමිකම් අධ්‍යයන කේන්ද්‍රය, කොළඹ විශ්ව විද්‍යාලය.

**පරිගණක සැකසුම** : මහේෂා අබේවික්‍රම

## ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ගරු සභාපතිතුමාගේ පණිවිඩය



*'ළමා වෙළඳාම හඳුනා ගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාව, ඉගෙනුම් කාර්ය භාවිතාව හා මෙවලම් ' යන මැයෙන් රචිත මෙම පුහුණු අත්පොත ළමා වෙළඳාමට එරෙහි ව කටයුතු කරන පාර්ශවයන්ගේ දැනුම හා කුසලතා ඉහළ නැංවීමේ අරමුණින් සම්පාදනය කරන ලද්දකි .*

ගෝලීය වශයෙන් දැඩි අවධානයට යොමු ව ඇති මෙම සංකීර්ණ හා අදෘශ්‍යමාන සමාජ ගැටලුව කිසියම් ජන සමාජයක ආර්ථික, සමාජීය හා සංස්කෘතික වශයෙන් එකිනෙක ගෙතුණු සාධක රාශියක් හේතුවෙන් පැන නගී. ළමා ආරක්ෂණ ක්ෂේත්‍රය ද ඇතුළුව සමස්ත ජන සමාජය කෙරෙහි මෙමගින් ඇති කෙරෙන බලපෑම් විනාශකාරී වේ. මෙම සංකීර්ණ අභියෝගයට එරෙහි ව සටන් කිරීමට අවශ්‍ය දැනුම හා පරිචය නිලධාරීන් වෙත ලඟා කර දීම අත්‍යවශ්‍ය බව මාගේ විශ්වාසයයි.

මෙම පුහුණු අත්පොත මගින් ළමා වෙළඳාම හා බැඳුණු මූලික සංකල්ප, එම සංසිද්ධිය ඇතිවීමට බලපාන සාධක හා එය ක්‍රියාත්මක වන ආකාර, එම ගැටලුවේ ප්‍රතිඵල, ඊට අදාළ ජාත්‍යන්තර නීති, සම්මුතීන්, දේශීය නීතිය මෙන් ම සමාජය හා පුරවැසියාගේ වගකීම් හා බැඳීම් යනාදි මාතෘකා පිළිබඳ ව ගැඹුරින් සාකච්ඡා කරනු ලැබේ. ඊට අදාළ පුහුණු කටයුතු සඳහා භාවිත කළ හැකි සිද්ධි අධ්‍යයන, අභ්‍යාස හා ඉගෙනුම් කාර්යය යනාදි පුහුණු මෙවලම් ද මෙහි අන්තර්ගත ය.

ළමා වෙළඳාමට එරෙහි පරිශ්‍රමයන්හි නිරත නිලධාරීන්ගේ දැනුවත්භාවයට මෙන් ම ඔවුන් විසින් මෙහෙයවනු ලබන පුහුණු කාර්යයන්හි දී පුහුණු මාර්ගෝපදේශයක් වශයෙන් ද මෙම සාරගර්භ පුහුණු අත්පොත භාවිත කළ හැකි ය. ළමා වෙළඳාම යන ගැටලුව ළමා ආරක්ෂණය සමඟ දැඩි ලෙස සම්බන්ධිත ය. මෙම අත්පොත මගින් ළමා ආරක්ෂණයෙහි නියැලී ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිලධාරීන්හට ඔවුන්ගේ දැනුම් පරාසයන් ඉහල නංවා ගනිමින් ස්වකීය දැනුවත් කිරීම් ඔස්සේ පොදු ජන සමාජය සවිබල ගැන්වීමේ ඉඩ ප්‍රස්ථා ද පුළුල් වනු ඇත.

ශ්‍රී ලංකාවේ දරුවන්හට සුරක්ෂිත අනාගතයක් උදා කරලීමේ අරමුණින් සිදු කළ මෙම මහඟු වෑයම යථාර්ථයක් බවට පත්කරලීම උදෙසා නන් අයුරින් සහාය දැක්වූ සියලුම නිලධාරීන් හා ආයතන වෙත මාගේ ගෞරව පූර්වක ස්තුතිය පළ කර සිටිමි.


මහාචාර්ය මුදිත විදානපතිරණ

MBBS (Col), DLM (Col), MD (Col), MA (SJP), FFFLM (UK)

සභාපති

ජාතික ළමා ආරක්ෂක අධිකාරිය

## විධායක සාරාංශය

ළමා වෙළඳාම හඳුනාගැනීම, වාර්තා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා පුහුණු විෂය මාලාවල ඉගෙනුම් කාර්යය සංග්‍රහය සහ මෙවලම් අත්පොත සැකසීමේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ අරමුණ වන්නේ ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ නිළධාරීන් ඇතුළු නීතිය බලාත්මක කරන නිළධාරීන් සහ ළමයින් සමඟ ඍජුව කටයුතු කරන රජයේ නිළධාරීන්ගේ දැනුම සහ ශක්‍යතා වර්ධනය කිරීමයි.

එසේම මෙම අත්පොත ළමා වෙළඳාම පිළිබඳ සිද්ධි හඳුනාගැනීම, වින්දිතයන් ආරක්ෂා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම සඳහා නීතිය බලාත්මක කරන නිළධාරීන් විසින් ගතයුතු පියවර පිළිබඳවද දැනුම ලබා දීමට සකසා ඇත.

# පටුන


| මොඩියුල අංකය | මොඩියුලයේ නම හා අන්තර්ගතය | පිටු අංකය |
|---|---|---|
| | | |
| 1 | **මූලික සංකල්ප හඳුනා ගැනීම** | |
| | 1.1 මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් අවබෝධ කර ගැනීම | 11-14 |
| | 1.2 ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ මාර්ගෝපදේශක මූලධර්ම | 15-16 |
| | 1.3 ළමා අයිතිවාසිකම් | 16-17 |
| | 1.4 සමාප්තිය | 18 |
| | **ඉගෙනුම් මෙවලම් (18,19,20)** | |
| | | |
| 2 | **ළමා වෙළඳාම හා එහි මූල හේතු හඳුනාගැනීම** | |
| | **a. ළමා වෙළඳාම හඳුනාගැනීම** | 21 |
| | 2.1 තැනැත්තන් වෙළඳාම | 21-23 |
| | 2.2 මිනිස් ජාවාරම | 23-27 |
| | 2.3 නීති විරෝධී සංක්‍රමණය | 27-28 |
| | 2.4 අපහරණය | 28-29 |
| | 2.5 පැහැරගෙන යාම | 29-30 |
| | 2.6 වහල්භාවය | 31-33 |
| | **b. ළමා වෙළඳාමට තල්ලු කරනා සහ ඇදගන්නා සාධක** | 33-35 |
| | **c. වෙළදාම සිදුකරන්නන්** | 35 |
| | 2.7 ලිංගික සූරාකෑම/ කාමුක දර්ශන | 35-37 |
| | 2.8 ශ්‍රම හෝ ආර්ථික සූරාකෑම | 37-39 |
| | 2.9 ළමා සොල්දාදුවන් | 39-40 |
| | 2.10 අවයව ඉවත් කිරීම සඳහා පුද්ගලයින් වෙළඳාම් කිරීම | 40-41 |
| | 2.11 දරුකමට හදා ගැනීම | 41-42 |
| | 2.12 විවාහය | 42-44 |
| | **ඉගෙනුම් මෙවලම් (23,25,34,44)** | |
| | | |
| 3 | **සැකැස්ම, අරමුණ සහ ප්‍රතිඵලය** | |
| | 3.1 දරුවන් වෙළදාම් කිරිම සිදු වන්නේ කෙසේද | 45-47 |
| | 3.2 වෙළදාම සිදුවන ප්‍රධාන ආකාර | 47-51 |
| | 3.3 වෙළදාම හා සම්බන්ධ අපරාධ වරදවල් - පූර්ව වෙළදාම් අවස්ථාව/වරදවල් සංයුක්තකරණය | 51-53 |
| | 3.4 වෙළඳාමේ ඵල විපාක | 53-56 |
| | **ඉගෙනුම් මෙවලම් (57,58)** | |


| | | |
|---|---|---|
| 4 | **මූලධර්ම රාමුව සහ අදාල සෙසු ලේඛන** | |
| | **a. අන්තර්ජාතික නෛතික රාමුව** | 59 |
| | 4.1 ශ්‍රී ලංකාව විසින් ළමුන් වෙළදාම් කිරීමට අදාල ලේඛන අපරානුමත කිරීමෙහි ලා වන තත්ත්වය | 59-60 |
| | 4.2 පැලමෝර් සංධානය යනු | 60-62 |
| | 4.3 ළමා අයිතිවාසිකම් සහ ළමුන් වෙළදාම් කිරීම සම්බන්ධයෙන් කටයුතු කරන සෙසු අන්තර්ජාතික ලේඛන | 63 |
| | 4.4 එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය | 64 |
| | 4.5 කාන්තාවන්ට එරෙහි සියලු ම ආකාරයේ වෙනස්කොට සැලකීම් තුරන් කිරීමේ සම්මුතිය (1979) (CEDAW) | 64-66 |
| | 4.6 එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය සහ එහි සංධානයන් | 66-68 |
| | 4.7 තැනැත්තන් වෙළදාම් කිරීම සහ වෙනත් අය වෛශ්‍ය වෘත්තියෙහි යොදවා සූරාකෑම වැළැක්වීම මර්දනය කිරීම සඳහා වන එ.ජා සම්මුතිය (1949) | 68-69 |
| | 4.8 බලහත්කාරයෙන් සේවයේ යෙදවීමට අදාල අන්තර් ජාතික කම්කරු සංවිධානයේ සම්මුතීන් | 70-72 |
| | 4.9 1966 සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබද අන්තර්ජාතික සම්මුතිය | 72 |
| | 4.10 විදේශගත ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය (1990) (විදේශගත ශ්‍රමිකයින් පිළිබඳ සම්මුතිය) | 72-73 |
| | 4.11 අන්තර්ජාතික මාර්ගෝපදේශ සහ මූලධර්ම | 73-76 |
| | **b. කලාපීය නෛතික රාමුව** | 76 |
| | 4.12 සාර්ක් සම්මුතිය පැහැදිලි කිරීම | 76-81 |
| | 4.13 තැනැත්තන් වෙළදාම් කිරීමට අදාල සෙසු කලාපීය ලේඛන | 82 |
| | **ඉගෙනුම් මෙවලම් (73,80)** | |
| | | |
| 5 | **දේශීය නීතිමය සහ ප්‍රතිපත්තිමය රාමුව** | |
| | 5.1 ළමුන් වෙළෙඳාම් කිරීම සම්බන්ධ දේශීය නීති සහ ප්‍රතිපත්ති | 83-85 |
| | 5.2 ළමුන් ද ඇතුලත්ව තැනැත්තන් වෙළෙඳාම් කිරීම | 86 |
| | 5.2.1 2006 අංක 16 දරන දණ්ඩනීති සංග්‍රහ සංශෝධන පනත - 360(ඇ) (1) වගන්තිය | 86-88 |
| | 5.2.2 2005 අංක 30 දරණ ගණිකා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමුන් වෙළෙඳාම් කිරීම වැළැක්වීමේ සම්මුති පනත (SAARC- සාක් සම්මුතිය) | 88-89 |
| | 5.2.3 තැනැත්තන් වෙළෙඳාම් කිරීම සම්බන්ධව දණ්ඩ නීති සංග්‍රහයේ වෙනත් විධිවිධාන | 90-96 |
| | 5.2.4 ළමයින් වෙළෙඳාම් කිරීම සම්බන්ධ අනෙකුත් නීතින් | 96-101 |
| | 5.3 ප්‍රතිකර්ම යාන්ත්‍රණ | 101-103 |
| | **ඉගෙනුම් මෙවලම් (89)** | |
| | | |
| 6 | **වගකීම් සහ බැඳීම්** | |
| | **a. සහභාගීත්වය, වළක්වා ගැනීම, ආරක්ෂණය, ප්‍රවර්ධනය හා පුනරුත්ථාපනය/ නැවත එක්කිරීම** | 105 |
| | 6.1 හැඳින්වීම | 105-107 |
| | 6.2 ළමා වෙළඳාම වැළැක්වීම සඳහා වූ වගකීම | 107-110 |
| | 6.3 වෙළඳාමට හසු වූ ළමා වින්දිතයන් ආරක්ෂාකර ගැනීම සඳහා වන වගකීම | 110-112 |
| | 6.4 ළමා වෙළඳාමේ වින්දිතයන් පුනරුත්ථාපනය කිරීම හා නැවත සමාජය සමඟ ඒකාබද්ධ කිරීම සඳහා වූ වගකීම | 112 |

| | | |
|---|---|---|
| | 6.5 සහභාගීත්ව සහ අයිතිවාසිකම් පදනම් කරගත් ප්‍රවේශයක් යොදා ගැනීමේ වගකීම | 112-113 |
| | 6.6 ළමා වෙළඳාම් විරෝධීබව ප්‍රවර්ධනය සහ නැවත සමාජගත කිරීමට වන වගකීම | 113 |
| | 6.7 නිගමනය | 113 |
| | **ඉගෙනුම් මෙවලම් (113,114)** | |
| | | |
| 7 | **තොරතුරු සමඟ ගනුදෙනු කිරීම** | |
| | **තොරතුරු ලබා ගැනීම, වාර්තා තබා ගැනීම, වාර්තා කිරීම සහ බෙදා හැරීම** | 115 |
| | 7.1 මිනිස් වෙළඳාම සම්බන්ධ ශ්‍රී ලංකා නීතිය | 115-119 |
| | 7.2 තොරතුරු ලබා ගැනීම | 119-121 |
| | 7.3 තොරතුරු පටිගත කිරීම | 124 |
| | 7.4 තොරතුරු වාර්තා කිරීම සහ බෙදා හැරීම | 125-128 |
| | 7.5 වගකිවයුතු වාර්තාකරණය සහ රහස්‍යභාවය පවත්වා ගැනීම සඳහා මාධ්‍යයේ කාර්යභාරය | 128-129 |
| | **ඉගෙනුම් මෙවලම් (119,122,123,125,129)** | |

# පළමු මොඩියුලය

| මූලික සංකල්ප හඳුනා ගැනීම | | |
|---|---|---|
|  | දේශන පැය ගණන | 2 |
|  | ඇගයීම් ක්‍රමවේදය | පන්තිකාමර සාකච්ඡා |
| | අධ්‍යයන අරමුණු | මෙම ඒකකය අවසානයේ දී සහභාගීවන්නන්ට:<br>➢ මානව හිමිකම් පිළිබඳ මූලික සංකල්ප හා ලක්ෂණ විස්තර කිරීමට<br>➢ ප්‍රධාන මානව හිමිකම් ලේඛන නම් කිරීමට<br>➢ ළමා අයිතිවාසිකම් සහ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ (CRC) මාර්ගෝපදේශක මූලධර්ම විස්තර කිරීමට සහ<br>➢ ළමා වෙළඳාම යනු ළමා අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමක් ලෙස අවබෝධ කරගැනීමට හැකියාව ලැබෙනු ඇත. |

## අ. මානව හිමිකම් හා ළමා අයිතිවාසිකම් පිළිබඳ සංකල්ප හඳුනාගැනීම




මූලාශය : http://leher.org/campaigns/infographics/human-rights-day/



## 1.1 මානව හිමිකම් සහ ළමා අයිතිවාසිකම් අවබෝධ කර ගැනීම

### 1.1.1 මානව අයිතිවාසිකම් පිළිබඳ හැඳින්වීමක්

මානව හිමිකම් යන්නට මිනිසුන් ලෙස ගෞරවාන්විතව ජීවත් වීමට අවශ්‍ය සදාචාරාත්මක හිමිකම්, සම්මතයන් සහ ප්‍රමිතීන් ඇතුළත් වේ. අද මානව හිමිකම් හඳුනාගෙන ඇත්තේ; "සියලුම මිනිසුන්ට ඔවුන්ගේ ජාතිකත්වය, පදිංචි ස්ථානය, ස්ත්‍රී පුරුෂ භාවය, ජාතික හෝ ජනවාර්ගික සම්භවය, වර්ණය, ආගම, භාෂාව හෝ වෙනත් ඕනෑම තත්ත්වයක් නොසලකා හිමිවන අයිතිවාසිකම්"[1] ලෙස ය. කිසිදු වෙනස්කමකින් තොරව මානව හිමිකම් භුක්ති විඳීමට සියලු ම මිනිසුන්ට සමාන අයිතියක් ඇත.

අන්තර්ජාතික සම්මුති නීතිය මානව හිමිකම්වල පවතින රාජ්‍යයන් සම්බන්ධයෙන් වන බන්ධනීය ස්වභාවය පිළිගනී. මානව හිමිකම් සහ මූලික නිදහස ආරක්ෂා කිරීම සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානය පහත සඳහන් ලේඛන පහෙන් සමන්විත "අන්තර්ජාතික මානව හිමිකම් ලේඛනය" සම්මත කළේ ය.

1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) (1948)
2) ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICESCR) (1966)
3) සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR) (1966)
4) සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ වෛකල්පිත සංධානය
5) මරණීය දණ්ඩනය අහෝසි කිරීම අරමුණු කරගත් සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතියේ දෙවන වෛකල්පිත සංධානය.

1948 දෙසැම්බර් 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR) සම්මත කරන ලද අතර එහි පළමු ව්‍යවස්ථාව ප්‍රකාශ කරන්නේ "සියලු මනුෂ්‍යයෝ නිදහස්ව උපත ලබා ඇති අතර ගරුත්වයෙන් හා අයිතිවාසිකම්වලින් සමාන වෙති" යනුවෙනි.

### 1.1.2 මානව හිමිකම්වල මූලික ලක්ෂණ

මානව හිමිකම්වල මූලික ලක්ෂණ පහත පරිදි වේ. මානව හිමිකම්[2];

- **සහජයෙන් ම හිමි වූ අයිතිවාසිකම් වේ (Inherent)** - මානව හිමිකම් සහජයෙන් ම හිමි වූ අයිතිවාසිකම් ලෙස සැලකෙනුයේ ඒවා කිසිදු පුද්ගලයෙකු හෝ අධිකාරියක් විසින් ලබා දී නොමැති බැවිනි. මිනිසාට මානව හිමිකම් ලැබෙන්නේ ඔවුන් මනුෂ්‍යයන් නිසා ම ය.
- **අන්සතු කළ නොහැකි වේ (Inalienable)** - මානව අයිතිවාසිකම් මිනිසුන්ට අයිති බැවින් ඒවා අන්සතු කිරීමට හෝ අහිමි කිරීමට නොහැකි අතර ඒවා ලබා දීමට හෝ උදුරා ගැනීමට ද නොහැකි ය.
- **වෙන් කළ නොහැකි වේ (Indivisible)** - මානව හිමිකම් වෙන් කළ නොහැකි ය. මානව හිමිකම් බෙදීමට හැකියාවක් නැත. සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය හෝ සංස්කෘතික අයිතිවාසිකම් වේවා සියලු මානව හිමිකම් සෑම පුද්ගලයෙකුගේම ගරුත්වයට ආවේණික ය.
- **එකිනෙක හා රඳාපවතින අතර එකිනෙක හා සම්බන්ධ වේ (Interdependent and Interrelated)** - මානව හිමිකම් එකිනෙක හා රඳාපවතින අතර එකිනෙක හා සම්බන්ධ වේ. සෑම අයිතිවාසිකමක් ම ඔහුගේ හෝ ඇයගේ සංවර්ධනාත්මක, ශාරීරික, මානසික හා අධ්‍යාත්මික අවශ්‍යතා තෘප්තිමත් කිරීම තුළින් මානව ගරුත්වය සාක්ෂාත් කර ගැනීමට දායක වේ.
- **විශ්වීය වේ (Universal)** - මානව හිමිකම්වල අදාළත්වය විශ්වීය වේ. යමෙකුගේ උපත සිදු වූ ස්ථානය, තත්ත්වය හෝ ස්වභාවය නොසලකා ඒවා අදාළ වේ.

[1] What are Human Rights?, Office of the High Commissioner-United Nations Human Rights, See Further;
[2] Human Rights Principles, United Nations Population Fund, 2005, https://www.unfpa.org/resources/human-rights-principles

### 1.1.3 සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් හා ආර්ථික, සමාජයීය හා සංස්කෘතික අයිතිවාසිකම්

පොදුවේ මානව හිමිකම් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් සහ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි (UDHR) 3 සිට 21 දක්වා වගන්තිවල දක්වා ඇති මානව හිමිකම් පහත පරිදි වේ;

- පුද්ගලයාගේ ජීවත්වීමේ අයිතිය, නිදහස සහ ආරක්ෂාව (3 වන ව්‍යවස්ථාව),
- කිසිම පුද්ගලයෙකු වහල්භාවයෙහි නොරැඳවිය යුතු ය. (4 වන ව්‍යවස්ථාව),
- කිසිම පුද්ගලයෙකු වධ හිංසාවට හෝ කෲර, අමානුෂික පහත් සැලකිල්ලකට හෝ දඬුවමකට හෝ භාජනය නොකළ යුතුය.
  (5 වන ව්‍යවස්ථාව),
- සියල්ලන් ම නීතිය ඉදිරියෙහි එකිනෙකාට සමාන වන අතර, කිසිදු විශේෂයක් නොමැතිව නීතීයේ ආරක්ෂාව ලැබීමට සියල්ලෝ ම හිමිකම් ලබති. (7 වන ව්‍යවස්ථාව),
- සිතීමේ, හෘදසාක්ෂියේ හා ආගම ඇදහීමේ නිදහස භුක්ති විඳීමේ අයිතිවාසිකම සෑම පුද්ගලයෙකුම සතුව ඇත. (18 වන ව්‍යවස්ථාව),
- තම නිදහස් මතය දැරීමට හා ප්‍රකාශ කිරීමට සෑම පුද්ගලයෙකුටම අයිතිය ඇත (19 වන ව්‍යවස්ථාව), මේවා ප්‍රධාන වශයෙන් සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් ලෙස සැලකේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයෙහි (UDHR) 22 සිට 28 දක්වා වගන්ති මගින් ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් සහතික කෙරේ;

- වැඩ කිරීමට හා තම රැකියාව නිදහස්ව තෝරා ගැනීමට ඇති අයිතිය (23 (1) වන ව්‍යවස්ථාව)
- සෞඛ්‍යය හා යහපැවැත්ම සඳහා ප්‍රමාණවත් ජීවන තත්වයක් සඳහා ඇති අයිතිය (25 වන ව්‍යවස්ථාව)
- අධ්‍යාපනයට ඇති අයිතිය (26 වන ව්‍යවස්ථාව), සහ
- ප්‍රජාවේ සංස්කෘතික ජීවිතයට නිදහසේ සහභාගී වීමේ අයිතිය (27 වන ව්‍යවස්ථාව)

එහි ප්‍රතිඵලයක් වශයෙන්, 1966 දෙසැම්බර් 16 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් රාජ්‍යයන් බැඳ තබන්නා වූ, සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය **(ICCPR)** සහ ආර්ථික, සමාජ හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය **(ICESCR)** සම්මත කරගන්නා ලදී. කෙසේ වෙතත්, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය අයිතිවාසිකම් අතර වෙනසක් නොදක්වන බව සඳහන් කළ යුතු ය.[3]

### 1.1.4 ළමා අයිතිවාසිකම් පිළිබඳ හැඳින්වීම

ළමයින්ට මානව හිමිකම් භුක්ති විඳීම සඳහා අයිතියක් ඇත. කෙසේ වෙතත්, දරුවන්ට විශේෂ අවශ්‍යතා ඇති හෙයින් තමන්ගේ ශාරීරික හා මානසික සංවර්ධනය සඳහා විශේෂ රැකවරණය, සැලකිල්ල, නඩත්තුව සහ අධ්‍යාපනය සඳහා ඔවුන් හිමිකම් දරයි.

**නීතිය මගින් විශේෂයෙන් දක්වා ඇති අයිතිවාසිකම් පිළිබඳ උදාහරණ**

- ළමයින්ට ආදරය, සැලකිල්ල, රැකවරණය සහ දෙමාපියන්ගේ හෝ භාරකරුවන්ගේ ආරක්ෂාව අවශ්‍යයි.
- දරුවන්ට අධ්‍යාපනය අවශ්‍යයි.
- දරුවන්ට නඩත්තු හා මූල්‍යමය සහය ලැබිය යුතුයි.

[3] https://www.ohchr.org/en/issues/escr/pages/areescrfundamentallydifferentfromcivilandpoliticalrights.aspx